මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013

# සිංහල - 1

**5 වසර** *කාලය පැ: 03 යි*

**I කොටසේ හා II කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද III කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

## I කොටස

01. i. කෙටි පිළිතුරු සපයන්න.

අ) නම්‍ය ස්වර සහ අනම්‍ය ස්වර ලියා දක්වන්න. (ලකුණු 02)

ආ) ට වර්ගයට අයත් ව්‍යඤ්ජනාක්ෂර 05 ලියන්න. (ලකුණු 02)

ii. අ) ත්‍රෛයිනිකායික, කෘතීම, ව්‍යංගාර්ථ, අත්‍යාවශ්‍ය යන වචන නිවැරදිව ලියන්න. (ලකුණු 02)

ආ) සමස්ත, කොට්ඨාශ, සම්ප්‍රධාන, වීරොධාර යන වචන වැරදි නම් නිවැරදි කරන්න. (ලකුණු 02)

iii. අ) නිවැරදි ක්‍රියාපද වරහන් තුළින් තෝරාගෙන හිස්තැන්වලට යොදා වාක්‍ය නැවත ලියන්න.

i. මානවිකා තොමෝ පැනට ................................ (යයි / යති)

ii. අප සමග ගුරුවරු ද ගමන් ................................ (කළෙමු / කළහ)

(ලකුණු 02)

ආ) සුදුසු පද වරහන් තුළින් ගෙන හිස්තැන් වලට යොදා වාක්‍ය නැවත ලියන්න.

i. ජනාධිපතිතුමා ගංවතුරෙන් විපතට පත් ප්‍රදේශවල ............................... චාරිකාවක යෙදුණි. (පරීක්ෂණ/ පයෝෂණ / නිරීක්ෂණ)

ii. යෝජනාවට විරුද්ධව වැඩි ඡන්ද ප්‍රමාණයක් ලැබීම නිසා එය ................................ විය. (නිෂ්ක්‍රීය / නිෂ්ප්‍රභ / නිෂ්ඵල)

(ලකුණු 02)

iv. අ) පහත සඳහන් වචන වලින් වඩාත් සුදුසු පදය යොදා හිස්තැන් පුරවන්න.

වාක් සම්ප්‍රදාය, වාක්කෝෂය, වාග්විලාසය, වාග්විද්‍යාව, වාග්ප්‍රහාරය

i. රාහුල හිමියන්ගේ ................................................ කොතරම් පුළුල් ද යන්නට සැළලිහිණි සංදේශයම දෙස් දෙයි.

ii. ............................... මගින් කෙරෙන්නේ භාෂාව භාවිත කරන ආකාරය පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයකි.

(ලකුණු 02)

ආ) නිවැරදි පද වරහන් තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

i. බසයට නැගුණු ගැබිනි .................................... (කාන්තාවක් / කාන්තාවක) දැක ශිෂ්‍යයා සිය අසුන ඇයට පිරිනැමී ය.

ii. සියලුම සිංහලයෝ ................................. (බෞද්ධයන් / බෞද්ධයෝ) නොවෙති.

(ලකුණු 02)

v. ආ) නිවැරදි පදය වරහන් තුළින් තෝරාගෙන හිස්තැන්වලට යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. බුදුජරජාණන් වහන්සේ ........................................ (නිශ්ශබ්දතාව / නිශ්ශබ්දතාවය) අගය කළහ.

ii. (පෞද්ගලික / පුද්ගලික) ............................................ බස් රථ ධාවනය ද ජනතා සේවයක් ඉටු කරන බව ඇමතිවරයා පැවසී ය.

(ලකුණු 02)

ආ) පහත දැක්වෙන වාක්‍යයෙහි සුදුසු තැන්වලට තිත, යුගල උඩුකොමා, කොමාව, ප්‍රශ්නාර්ථ ලකුණ යන විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

කාලගෝලයා ද දික්තල අත අල්ලාගෙන තෝ නොසිට කොයි යේද සත් අවුරුද්දක් ගෙයි කඹුට ලත් මගේ අඹු වේදැයි කලහ කෙරෙමින් ශාලාව සමීපයෙන් යන්නේ ය (ලකුණු 02)

vi. අ) පහත දැක්වෙන පද පේළිවල මුල් පදයට සමානාර්ථ නොවන පදය තෝරා ලියන්න.

i. භෝජන - අන්න, බොජුන්, පායාස, අහර

ii. අහස - නුබකුස, අඹර, ගගන, දිනමිණ

(ලකුණු 02)

ආ) √ලිය (ලීමෙහි) √වපුර (වැපිරීමෙහි) √ගය (ගැයීමෙහි) √පිස පිසීමෙහි ධාතු ප්‍රකෘතිවලට සුදුසු ප්‍රත්‍ය යොදා ප්‍රයෝජ්‍ය ක්‍රියා තනන්න.

(ලකුණු 02)

vii. අ) වරහන් තුළ ඇති විසන්ධි පද සන්ධි කර හිස් තැන්වලට යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. (අභි + අන්තර) .................................. ශිෂ්‍යයන්ට මෙන් ම බාහිර ශිෂ්‍යයන්ට ද තරගය සඳහා ඉදිරිපත් විය හැකි ය.

ii. (අනු + අර්ථ) ඇතැම් පුද්ගලයන්ට .................................. නාම තැනෙන්නේ ඔවුන්ගේ ගති පැවතුම් හා ක්‍රියාකලාපයන් අනුව ය. (ලකුණු 02)

ආ) තද කළු අකුරින් මුද්‍රිත වචනවල නාම හා විභක්ති ප්‍රත්‍ය වෙන් කර දක්වා ඒවායේ විභක්ති නම් කරන්න.

i. ඇමතිතුමා **ලේඛකයාට** උපහාර පිරිනැමීය.

ii. දරුවාගේ දක්ෂකම **ගුරුවරයාගේ** ප්‍රශංසාවට ලක් විය. (ලකුණු 02)

viii. අ) පහත සඳහන් තද කළු අකුරින් මුද්‍රිත පද සමූහය වෙනුවට සමාස නාම ලියන්න.

i. **ගවයන් පාලනය කරන තැනැත්තා** උදෑසන ම ගවයන් දක්කාගෙන තණ පිටියට යයි.

ii. බුදුරජාණන් වහන්සේට **සිංහයකු බඳු ශාක්‍යයා** යන නම ද යෙදේ.

(ලකුණු 02)

ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

i. දන්ත වෛද්‍යවරයා දත් රෝගීන් පරීක්ෂා කළේ ය.

ii. නවකතා රචකයෝ නවකතා සඳහා ස්වකීය අත්දැකීම ද පාදක කර ගනිති.

(ලකුණු 02)

ix. ඇ) පහත සඳහන් වාක්‍යවල හිස්තැන්වලට තද කළු අකුරින් මුද්‍රිත පද වලින් තැනෙන තද්ධිත පද ලියන්න.

i. **(රනින් කළ)** ............................................. පිළිමය අනුරාධපුර යුගයට අයත් බව පුරාවිද්‍යාඥයෝ පවසති.

ii. බටහිර අහසෙහි **(ආලෝකයෙන් යුත්)** වස්තුවක් දෘශ්‍යමාන වූ බව ප්‍රදේශවාසී හු ප්‍රකාශ කළහ.

(ලකුණු 02)

ආ) පහත සඳහන් රකාරාන්ත ධාතුවලින් තැනෙන අතීත කෘදන්ත පදය බැගින් ලියන්න.

√වදාර (වැදෑරීමෙහි) √වපුර (වැපිරීමෙහි) (ලකුණු 02)

x. ඇ) පහත සඳහන් පාඨයේ ඇති නිපාත පද පහක් දක්වන්න.

"ප්‍රත්‍යාර්ථ නාම හෙවත් තද්ධිත හා කෘදන්ත පද ශබ්ද ප්‍රකෘතියකට හෝ ධාතු ප්‍රකෘතියකට ප්‍රත්‍යයක් එක්වීමෙන් තැනෙන පදය විශේෂයක් බව ගුරුතුමා පැවසී ය" (ලකුණු 02)

ආ) පහත දැක්වෙන පදවල ඇතුළත් උපසර්ග වෙන් කර දක්වන්න.

i. සපිරිකර ii. අභිධර්මය iii. අනෞචිත්‍ය

iv. නිරාවරණ (ලකුණු 02)

## II කොටස

02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 250 පමණ වනසේ රචනයක් ලියන්න.

i. ඇතැම් ගුවන්විදුලි හා රූපවාහිනී නාලිකා මගින් කෙරෙන හෙළ බස වැනසුම.

ii. දෙවන භාෂාවක් වශයෙන් ඉංග්‍රීසි ඉගෙනීමේ වැදගත්කම.

iii. ගව ඝාතනය පිටුදකිමු.

iv. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය.

v. අපේ ප්‍රෞඪ ඉතිහාසය ලොවට කියන පුරාවස්තු. (ලකුණු 15)

03. පහත දී ඇති පද්‍ය යුගලය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සෙංකඩගල නුවර බැබළෙන හඳ පානේ
සිංහල රටේ පිළිබිඹු වුණ අබි මානේ
නංවන මිහිර හෙළ කවියකු හද යානේ
පින් කළ ඇත් රජුනි කඳුකර රජ දානේ

මුව දෙකොනින් ම විහිදුණු සුදු යුග දළය
පිළිබිඹු කෙරෙහි ඔබගේ අසදිය බලය
බිය මුසු සැදැහැයෙන් ගුම් ගන්වන හෙළය
ඔබ සක්විති රජය පෙරහැර සක් වළය

i. මෙහි වර්ණනාවට ලක් වන්නේ කවරෙකු ද ?

ii. "අසදිස බලය" යන්නෙහි තේරුම කුමක්ද ?

iii. මෙහි දැක්වෙන රූපක අලංකාර සහිත පද දෙකක් ලියන්න.

iv. මේ පද්‍යවල ඇතුළත් කෘදන්ත දෙකක් ලියන්න.

v. මෙහි එන ආලපන විභක්ත්‍යාර්ථ පදය කුමක්ද ? (ලකුණු 15

## III කොටස

04. පහත දැක්වෙන ඡේදය වචන 40 කින් පමණ සාරාංශකර ලියන්න.

වාරි සංස්කෘතියේ මූලිකාංගය වූ වැවක් බැඳ ගැනීම ලෙහෙසි කටයුත්තක් නොවේ. ඒ සඳහා ශ්‍රමිකයන් අතිවිශාල සංඛ්‍යාවක් අවශ්‍ය වේ. එසේම වාපිය සඳහා සුදුසු භූමියක් තෝරා ගැනීමත් වැදගත් වේ. මෙහිදී බිම් හැඳින ගැනීම නම් මූලික කාර්යය සිදු කෙරෙන අතර ඒ සඳහා යෝජිත ප්‍රදේශයේ භූගෝලීය පිහිටීම ආදී සියලුම කරුණු අධ්‍යයනය කෙරේ. වැව් බැඳවීමට සුදුසු තැන ධාතුසේන රජුට සොයා දුන්නේ වැද්දෙකු විසින් බව පැවසේ. මින්නේරිය වැව බැඳීමට සුදුසු තැන පෙන්වා දෙන ලද්දේ සිහිනයෙන් දෙවියන් විසින්ය යන ජනශ්‍රැතිවල පදනම විය හැක්කේ ඒ තෝරා ගැනීමේ වැදගත්කමත්, දුෂ්කරතාවත් ඉස්මතු කිරීම සඳහා විය හැකිය. මහසෙන් රජුට මින්නේරිය වැව පිළිබඳ හොඩුවාව ගෙනා එළදෙනක පිළිබඳ රසවත් කථා පුවතක් මුඛ පරම්පරාවේ එයි.

(ලකුණු 15)

05. ප්‍රදේශයේ රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටවිය යුතු බවටත්, ඊට සුදුසු ඉඩ පහසුකම් ඇති ගොඩනැගිල්ලක් ඉදි කළ යුතු බවටත් කැප්පෙටිපොළ - නැදුන්ගමුව විශ්වමිත්‍ර යෞවන සමාජයේ ලේකම් වන සඳරුවන් කරුණාජීව ඔබ යැයි සිතා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීමෙන් ප්‍රදේශයේ තරුණ තරුණියන්ට සිදුවන සේවය පිළිබඳ සඳහන් කරමින් හා ඒ සඳහා ප්‍රදේශයේ දානපතියන් ධන පරිත්‍යාග කිරීමට සූදානම් ව සිටින බවත් සඳහන් කරමින් දැනට ප්‍රජා ශාලාව පවතින භූමියේ නව ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා අවසර ඉල්ලමින් කැප්පෙටිපොළ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න. (වචන 100 ක් පමණ භාවිත කිරීම ප්‍රමාණවත්ය)

(ලකුණු 15)

The National e-learning Portal for the General Education

06. පුරුෂ ලිංග නාම පද ස්ත්‍රී ලිංගයට හැරෙන විධි උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 15)